www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

### ලෙබනනයේ ජන ඝාතනය සිව් වන සතියට එලඹෙයි

# යුද්ධයට එරෙහි අරගලයේ ඉදිරි මාවත කුමක් ද?

**Slaughter in Lebanon enters fourth week**
**What way forward in the struggle against war?**

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**
**2006 අගෝස්තු 02**

ලෙබනන් ජනතාවට එරෙහි එක්සත් ජනපද - ඊස්රායල මිලේච්ඡ යුද්ධය එහි සිව් වන සතියට එලඹෙන විටත්, අහිංසක සිවිල් වැසියන් සංහාරයේ අවසානයක් දකීමට නොහැකි වී ඇත. එයට පටහැනිව, පෙනීයන පරිදි එහි එල්ලය, කාලතුවක්කු හා ගුවන් ප්‍රහාරයන්ගේ ආවරනය යටතේ ඊස්රායල් ආරක්ෂක හමුදා (අයිඩීඑෆ්) ඊස්රායල් දේශ සීමාව හා සැතපුම් 18ක් දුර ලෙබනනයේ ලිටානි ගංගාව තෙක් ප්‍රදේශය තුලට කාවැදීම සඳහා, සමස්ත ජනගහනයම පලවා හැරීම හෝ ඝාතනය කිරීම බවයි.

ඊස්රායල් ගොඩබිම් හමුදා, ලෙබනන් - සිරියා දේශ සීමාව ආසන්නයේ බෙකා නිම්නයට ද ඇතුලු වී තිබේ.

මහජනතාවගෙන් මිලියන හතරෙන් තුන්පංගුවක් සරනාගතයන් බවට පත් කරමින් ද, දහස් ගනනකට තුවාල සිදු කරමින් ද, 700ක ජීවිත බිලි ගනිමින් ද, රටේ යටිතල පහසුකම්වලින් බොහෝමයක් අඩපන කරමින් ද, දකුනු ලෙබනනය හා බේරූට්හි දකුනු ප්‍රදේශය සුන්බුන් බවට පත් කරමින් ද කෙරෙන බෝම්බ හෙලීම මධ්‍යයේ, පසු ගිය තෙසතියෙහි භීෂනය, තවත් බිහිසුනු සංහාරයක ආරම්භක පෙර දසුන පමනක් බව සැලකීමට ඕනෑවටත් වඩා හේතු සාධක පවතී. හැටකට වැඩි සංඛ්‍යාවකගේ ජීවිත බිලිගත් යුද අපරාධය - වැඩිදෙනෙක් ලමයින් වූ කානාහි ඝාතනය- එලඹෙන දින හා සති තුලදී ප්‍රදේශය පුරා යලිත් සිදු කරනු ඇත.

කානා ඝාතනයෙන් පසුව, ඊස්රායල් ආන්ඩුව ප්‍රකාශයට පත් කල, එහෙත් තෝරා ගත් ඉලක්ක වෙත පහර දීමේ දී බොහෝවිට නොතකා හල, පැය 48ක බෝම්බ හෙලීම් අත් හිටුවීමේ ඊනියා ප්‍රකාශනය, ලෙබනනයට එරෙහි ගුවන් ප්‍රහාර බඳාදා උදෑසනම යලි ඇරඹීමත් සමග ම, දැනටමත් බිඳ දමා ඇත. ඊස්රායල් ප්‍රහාරක යානා මගින් ප්‍රථම වතාවට, සිය නිවාසවලින් පලා නොයන්නේ නම් බෝම්බ හා මිසයිල ප්‍රහාරවලට ගොදුරු විය හැකි බව සඳහන් පත්‍රිකා, ලිටානි ගඟෙන් උතුරේ වැසියන් මතට ද හෙලනු ලැබී ය.

මීට පෙර ප්‍රහාරයන් හි දී තුවාල ලත් ජනයාගෙන් පිරි, බෙකා නිම්නයේ බාල්බෙක් නගරයෙහි ආරෝග්‍යශාලාවකට ඊස්රායල් ප්‍රහාරක හෙලිකොප්ටර් මගින් බෝම්බ හෙලූ බව ඇසින් දුටුවන් වාර්තා කර තිබේ.

ඊස්රායලයේ ආරක්ෂක කැබිනට්ටුවෙහි සාමාජිකයෙක් වන, වෙලඳ ඇමති ඊලි යෂායි හමුදා ගුවන් විදුලියට ප්‍රකාශ කලේ, මෙම සතියෙහි සටන් විරාමයක් සඳහා එක්සත් ජාතීන්ගේ ඡන්දයෙන් ඇතිවන්නේ සුලු අන්තරායක් බවත්, එය වුවත් ඊස්රායලය සැලකිල්ලට නොගන්නා බවත් ය.

"එක්සත් ජාතීන් සටන් විරාමයක් තීන්දු කරනු ලැබුවත් එය පිලිපැදීමට හෝ ඒ අනුව සිය මෙහෙයුම් අත්හිටුවීමට ඊස්රායලය බැඳී නැත"යි ඔහු ප්‍රකාශ කලේ ය. "අපගේ කොන්දේසි මත මිස" කිසිදු සටන් විරාමයක් පිලිගැනීමේ අදහසක් ඊස්රායල් ආන්ඩුවට නැති බවත් එවැන්නක දී "අපගේ ඇමරිකානු මිතුරන් සිය නිෂේධ බලය යොදනු ඇති බවත්" ඔහු කියා සිටියේ ය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ ස්ථාවර සාමාජිකයෙකු ලෙස, ඕනෑ ම යෝජනාවකට එරෙහිව නිෂේධ බලය යෙදීමේ වොෂින්ටනය සතු බලය ගැන අඟවමිනි. ඔහු හා අනෙකුත් ඊස්රායල බලධාරීන් ඉඟි කලේ ආක්‍රමනකාරී යුද්ධය අවම වසයෙන් තවත් සති කිහිපයක් පවතිනු ඇති බවයි.

ලෙබනනයට එරෙහි යුද්ධයේ දී, සිය අනුග්‍රාහකයා වන වොෂින්ටනයේ සහයෝගය පිලිබඳව විශ්වාසය රැඳවීම සඳහා ඊස්රායලයට බොහෝ හේතු සාධක පවතියි. බුෂ් පරිපාලනය, හුදෙක් ඊස්රායලයට සිය පිටුබලය සපයනවා පමනක් නොව, ලෙබනනයේ ෂියා මුස්ලිම් හෙස්බුල්ලා ව්‍යාපාරය තලා දැමීමේ ප්‍රකාශිත අරමුන ඉටු කර ගන්නා තෙක්, ආක්‍රමනය පුලුල් කිරීම සඳහා ඊස්රායලය උසිගන්වන බවට ද කිසිදු සැකයක් නැත.

විපතට පත් සෑම ඊස්රායල් ජාතිකයෙක් වෙනුවෙන් ලෙබනන් සිවිල් වැසියන් 30ක් විනාශයට පත් කල හා දශක ගනනාවක් ලෙබනනය ආපස්සට ඇද දැමූ යුද්ධයක් සඳහා, වොෂින්ටනය ඊස්රායලයට ලබා දුන් තුච්ඡ හා නිර්ලජ්ජිත සහයෝගය, ඊස්රායල් මිලිටරියේ

ම්ලේච්ඡ ආක්‍රමනයටත් වඩා, ලෝක ජනමතය සසල කලේ ය.

බුෂ් ජනාධිපති තනතුර හෙබවූ පලමු වටයේ දී, ප්‍රතිපත්ති හා සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාව සිටි රිචඩ් හාස් හා හිටපු නියෝජ්‍ය රාජ්‍ය ලේකම් රිචඩ් ආමිටේජ් වැනි, බුෂ් පරිපාලනයේ හිටපු ප්‍රමුඛ නිලධාරින්, රාජ්‍යතාන්ත්‍රික මධ්‍යස්ථ භාවයක් මවාපෑමට පවා පරිපාලනය අසමත්වීම පිලිබඳව මවිතය පලකර තිබේ.

බුෂ් හා අනෙකුත් ඉහල නිලධාරින්, "කල් පවත්නා වූ සාමයක්" සඳහා කැඳවුම් කරන ලෙබනනයේ ක්ෂනික සටන් විරාමයකට යලි යලිත් සිය විරෝධය පලකර තිබේ. මෙහි අර්ථය වන්නේ, එදිරිවාදිකම් අත්හිටුවීම පිලිගතහැක්කේ, එක්සත් ජනපදය හා ඊස්රායලය සිය යුද අරමුනු මුලුමනින් ම මුදුන් පත් කර ගැනීමේ පදනම මත පමනක් ය යන්න ය. 1930 ගනන් හා 40 ගනන්වල දී මේ සමාන "සටන් විරාමයක්" තුන්වැනි රීචය විසින්, පෝලන්තයේ, ප්‍රන්සයේ හා වෙනත් තැන්වල අටවනු ලැබූහ.

හෙස්බුල්ලාවරුන් ජුලි 12 වන දින ඊස්රායල් භටයන් දෙදෙනෙක් අල්ලා ගැනීම, වත්මන් යුද්ධයට හේතුව නොවන බවත්, එය කලක් තිස්සේ සැලසුම් කල ආක්‍රමනයක් දියත් කිරීමට යොදා ගත් හුදු නිමිත්තක් පමනක් බවත් හිතාමතාම ඇස් පොට්ට කර නොගන්නා ඕනෑ ම අයෙකුට දැන් පැහැදිලි වන කාරනයකි. වොෂින්ටනය සිය පූර්න ආශීර්වාදය ලබාදීමෙන් තොරව, මෙම යුද්ධය ඊස්රායල ආන්ඩුව විසින් තීන්දු කරනු ලැබූවක් ද නොවේ. එයට වෙනස් ලෙස, තෙවසරකට පෙර ඉරාක ආක්‍රමනය දියත් කිරීමත් සමග මැද පෙරදිග තුල එක්සත් ජනපද මැදිහත් වීම, තව දුරටත් ව්‍යාප්ත කිරීම හා ගැඹුරු කිරීම මෙයින් නියෝජනය කෙරේ.

මෙම යුද්ධයේ අරමුන හුදෙක් හෙස්බුල්ලාවරුන්ට එරෙහිව ඊස්රායලය සුරැකීම නොවේ. ඊනියා " ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය යුද්ධය" මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ සංකේන්ද්‍රිතව ඇති තෙල් සම්පත් මත වොෂින්ටනයේ ග්‍රහනය පිහිටුවා ගැනීම කරා යොමු වූ, කොල්ලකාරී ප්‍රතිපත්ති සඳහා නීතියුක්ත භාවයක් අත් කර දීම මගින්, එම කලාපයේ එක්සත් ජනපද මූලෝපායික අරමුනු මුදුන් පමුනුවා ගැනීම එහි අරමුන ය. අනෙක් අතට මෙය, ගෝලීය රාජ්‍යාන්තර නායකත්වය සඳහා වන එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අරමුනු සඳහා තීරනාත්මක වන බව ද සැලකිල්ලට ගැනේ.

ලෙබනනයට එරෙහි යුද්ධය සඳහා බුෂ් පරිපාලනය ලබා දෙන සීමා රහිත සහයෝගය ද සමග එක්සත් ජනපද අධිරාජ්‍යවාදය එහි සැබෑ අරමුනු ලෙස ඓතිහාසිකව පෙන්වා ගෙන සිටි ප්‍රජාතන්ත්‍රවාදී සහ සාමවාදී රඟපෑම ඉවත දැමී ය. යුද්ධය හා සිවිල් ජන සංහාරය, විදේශ ප්‍රතිපත්තියේ උපකරන ලෙස යලිඳු වතාවක් නීති යුක්ත කරනු ලබයි.

බුෂ්ගේ හා චේනිගේ "පූර්ව භංග යුද්ධය" හා "21 වැනි සියවසේ නව්‍ය යුද්ධයන්" පිලිබඳ සියලු කතා දැන් එහි නියම පැහැයෙන් දැක ගත හැකි ය. ඉරාක ආක්‍රමනය වනාහි, ඇමරිකාවේ ව්‍යාපාරික හා මූල්‍ය ප්‍රභූ පැලැන්තියේ ගෝලීය අවශ්‍යතාවන් සුරැකීම සඳහා මිලිටරි භීෂනය හා ත්‍රස්තය පුලුල් ලෙස යොදා ගැනීමක ආරම්භය පමනි.

ලෙබනනයට එරෙහි ඊස්රායලයට පිදෙන එක්සත් ජනපද සහයෝගය, හුදෙක් අනාගතයේ දී ඉරානයේ ද, සිරියාවේ ද, "පාලන තන්ත්‍ර වෙනසක් " සඳහා යොදා ගැනීමේ අරමුන සහිත, මිලිටරි ව්‍යායාමයේ එක් පියවරක් පමනි. වොෂින්ටනයේ අභිප්‍රාය වන්නේ, සිය ගෝලීය අභිලාෂයන්ට අභියෝගයක් එල්ල කරන කිසිදු පාලන තන්ත්‍රයකට බලයේ රැඳී සිටීමට ඉඩ නොතැබීම යි.

ආසියාවේ ද, යුරෝපයේ ද, ෆැසිස්ට්වාදීන් මෙන්ම අධිරාජ්‍යවාදීන් ද ගෙන ගිය බිහිසුනු අපරාධයන් ගෙන් ද, දෙවැනි ලෝක සංග්‍රාමය අවසන් වීමෙන් ද පසුව, ලෝක බලවතුන්, ජාතික අවශ්‍යතාවන් පෙරට ගෙනයාමේ මාධ්‍යයන් ලෙස, ආක්‍රමනකාරී මිලිටරි බලය යොදා නොගැනීමට විධිමත් ලෙස දිව්රුම් දුන්හ. එක්සත් ජාතීන්ගේ මන්ඩලය පිහිටුවන ලද්දේ, එහි ආරම්භක ප්‍රඥප්තිය තුල "අපගේ ජීවිත කාලය තුල දෙවතාවක්ම මානව වර්ගයාට කිව නොහැකි තරම් දුක් පීඩාවන් ගෙන ආ යුද්ධයෙන් අනාගත පරම්පරාවන් බේරාගන්නා" බවටත් "පොදු අවශ්‍යතාවකදී හැර සන්නද්ධ අවි බලය යොදා නොගන්නා බවටත් ප්‍රකාශිත දිව්රුම් දීමෙනි.

මෙම ගාම්භීර වදන් ඇතුලත් ලියවිල්ල අද හිස් කඩදාසියක් බවට පත්ව තිබේ. දේශපාලන අරමුනු මුදුන්පත් කර ගැනීමේ පිලිගත හැකි මාධ්‍යයන් ලෙස, ලෝකයේ ප්‍රමුඛ දේශපාලන බලවතා විසින් යුද්ධය යලිඳු වතාවක් නීති යුක්ත කර තිබේ. මාධ්‍ය වෙත නිකුත් කරන කුහක ප්‍රකාශ මගින්, අහිංසක ලමුන් ඝාතනය කිරීම ගැන ඒ වෙලාවට සංවේගය පලකරනු ලැබුවත්, භාවිතයේ දී ඒවා "පාර්ශ්වීය හානි" ලෙසත්, මූලෝපායික අරමුනු මුදුන් පමුනුවා ගැනීම සඳහා නොවැලැක්විය හැකි හා පිලිගතයුතු මිල ගෙවීමක් ලෙසත් බැහැර කරනු ලැබේ.

යථාර්ථයේ දී ඓතිහාසික ඔරලෝසුව ආපසු කරකවා ඇත. දෙවැනි ලෝක සංග්‍රාමය ආසන්නයේ 1930 ගනන්වල ලෝක කටයුතුවල දී ආධිපත්‍ය දරූ ජාත්‍යන්තර අනීතියේ ආක්‍රමනයේ හා මිලිටරිවාදයේ විධික්‍රමයන් පලිය ගැනීමේ ස්වරූපයෙන් යලි පන ගැන්වී තිබේ.

මෙය හුදෙක්, එක්සත් ජනපද ආන්ඩුව මත, යම් අසම්මත, ප්‍රතිගාමී ප්‍රතිපත්තීන් පටවනු ලබන "නව සංස්තිතිකවාදීන්" කල්ලියක හා බුෂ්, චේනි පිබඳ කාරනයක් පමනක් නොවේ. දෘෂ්‍යමාන විරුද්ධ පක්ෂයේ ඩිමොක්‍රටිකයන්, ඊස්රායල් යුද්ධයට ඔවුන් පලකරන සහාය තුලින් පරිපාලනය ඉක්මවා යෑමටත්, සමහර කරුනුවල දී පරිපාලනය දකුනෙන් විවේචනය කිරීමටත් උත්සාහ දරති. සියොන්වාදී තන්ත්‍රය, ගැහැනුන් හා ලමුන් සංහාරය කරද්දී පවා එහි ඕනෑ ම හා සියලු ම ක්‍රියාවන් එක හෙලා අනුමත කරන අතර, නිව් යෝර්ක් සෙනෙට් සභික හිලරි ක්ලින්ටන් වැනි දේශපාලනඥයන් ඊස්රායලයේ "ආත්මාරක්ෂාව සඳහා වූ අයිතිය" සඳහා ඔවුන්ගේ කොන්දේසි විරහිත සහයෝගය ප්‍රකාශ කරති.

ඇමරිකානු දේශපාලන සංස්ථාපිතය ඇතුලත කිසිදු සැලකිය යුතු විරුද්ධ පාර්ශවයක් ඇත්තේ නැත. මාධ්‍ය තුල, යුද්ධය පවත්වා ගෙන යාම සඳහා වන සහයෝගය මුලුමනින් ම පාහේ ඒකමතික ය. බුෂ් පරිපාලනයේ හා එක්සත් ජනපද මූල්‍ය ප්‍රාග්ධනයේ දෘෂ්ටිය පිලිබිඹු කරමින් *වෝල්ස්ට්‍රීට් ජර්නලය* අගහරුවාදා ප්‍රකාශ කලේ "රාජ්‍ය ලේකම් රයිස් රාජ්‍යතාන්ත්‍රික විකල්පයන් ඒත්තු ගන්වමින් සිටින අතර, බුෂ් මහතා පෞද්ගලිකව ඊස්රායල් අගමැති ඕල්මර්ට් හට කියා සිටින්නේ, " හෙස්බුල්ලාවරුන්ට එරෙහිව ඔහු ආරම්භ කල මෙහෙයුම ඊස්රායලය විසින් අවසානයකට ගෙන ආ යුතු බවයි. අවශ්‍යවන්නේ එය නම් දකුනු ලෙබනනය ගොඩබිමින් ආක්‍රමනය කිරීම ද මීට ඇතුලත් ය." අපගේ බලාපොරොත්තුව වන්නේ. "ඊස්රායලය මිලිටරිමය වසයෙන් හැකිතාක් වේගයෙන් ඉදිරියට යෑමේ අධිෂ්ඨානය ප්‍රදර්ශනය කිරීම පමනකි." යනුවෙනි.

කානා සංහාරයෙන් දින ගනනකට පසුව *වොෂින්ටන් පෝස්ට්* වැලපුනේ මෙසේ ය. " ඊස්රායලයේ අත්වැරදීම් හා වැඩි වැඩ පිලිබඳව ලෝකය පුරා ජනමාධ්‍ය දහරාවන් පෙර දැකියහැකි අවධානයකින් පසුවිය යුතු ය." ඉන්පසු යුද්ධය ජයග්‍රහනය තෙක් ඉදිරියට ගෙන යායුතු බව කියා සිටියේ ය. ලෙබනනය සඳහා බලය පැවරීමේ දී එක්සත් ජාතීන් විමසිය යුතු වග කාරනය නම්, "ඊස්රායලය දැන් කරගෙන යන මිලිටරි ව්‍යාපාරයට මෙයින් කොතරම් ප්‍රමානයක් පැවරිය යුතු ද හා ජාත්‍යන්තර හමුදාවට කොතරම් පැවරිය යුතු ද තීරනය කිරීමයි." එහි කතු වැකිය සඳහන් කලේ ය.

ලෙබනන් යුද්ධයේ පුලුල් අරමුනු කෙරෙහි යොමු වෙමින් එය මෙසේ සඳහන් කරයි. "එලඹෙන සතිවල දී ඉරාන හා සිරියානු ආන්ඩු එක දිගට නිකුත් කරන පනිවිඩයට ඇහුම්කන් දීම අවශ්‍ය ය. ඉරාකයේ සිට ලෙබනනය හා ගාසා දක්වා මැද පෙරදිග ස්ථාවර කිරීමට එක් වීමේ තීරනයක් ගැනීමෙන් වර්තමානයේ ඔවුන්ගේ හුදෙකලාව මැකී යනු ඇත. එහෙත් ජනසංහාරක අවි අත්පත් කර ගැනීමේ උත්සාහයන් හෝ හෙස්බුල්ලාවරු වැනි කන්ඩායම් හරහා වකුටු යුද්ධයක් ගෙනගියහොත් පිලිතුරු ලෙස ලැබෙනු ඇත්තේ සහජීවනය නොව බලය යෙදීම යි."

වෙනත් වචනවලින් කිවහොත් එක්සත් ජනපද ඊස්රායල ආඥාවන්ට යටත් වනු නැතහොත් ලෙබනනයේ වැනි ඉරනමකට මුහුන දෙනු යන්න ය.

ප්‍රමුඛ ජාත්‍යන්තර ආයතන සනාත කර ඇත්තේ එක්සත් ජනපද- ඊස්රායල යුද මදාවියට විරුද්ධ වීමේ දී ඒවායේ පරිපූර්න අසමත් කමයි. 1930 ගනන් වල ඉතාලි ෆැසිස්ට්වාදීන් විසින් සිය රට ආක්‍රමනය කල අවසථාවේ දී ඉතියෝපියාවේ හේල් සිලාසිගේ ආයාචනයට ජාතීන්ගේ සංගමයෙහි ප්‍රතිචාරයට වැඩි කිසිවක් එක්සත් ජාතීන්ගේ සංවිධානයන් තුල නොවීය. අඟහරුවාදා, ලෙබනනයේ සටන් විරාමයක් ඉල්ලා සිටින යෝජනාවක් සම්මත කර ගැනීමට අසමත් වීමෙන් යුරෝපා සංගමය සනාථ කලේ යුරෝපීය ධනේශ්වරයේ කොන්ද පන නැති කමයි. ඒ වෙනුවට ඔවුන් ජෝර්ජ් බුෂ්ගේ ප්‍රධානම ගැත්තා වන බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර්ට අනුගත වූයේ, මිහිකත පුලුස්සා දැමීම සඳහා ඊස්රායල මිලිටරියට තවත් සති ගනනාවක් කල් ලබා දීමේ අරුතින් යුත් ව්‍යාකූල සූත්‍රගත කිරීමක් වූ "එදිරිවාදිකම් අත් හිටුවීම" සඳහා ඔහු කල කැඳවීම තෝරා ගනිමිනි.

ලෙබනනයේ සිදුවීම්, මැද පෙරදිග පමනක් නොව එක්සත් ජනපදයේ ද ජාත්‍යන්තරව ද වැඩ කරන ජනතාවන්ට දැඩි අනතුරු ඇඟවීම් ගැබ්කර ගනී.

විදේශයන්හිදී වොෂින්ටනයේ එන්ට එන්ටම පුලුල් වන යුද්ධයන්හි සටන් කිරීම සඳහා බලහත්කාරයෙන් හමුදාවට තරුනයන් බඳවා ගැනීමේ කෙටුම්පත එක්සත් ජනපදය තුල යලි ක්‍රියාත්මක කිරීම තව කොතෙක් ප්‍රමාද වනු ඇත් ද?

.....

ඉරාන න්‍යෂ්ටික වැඩ පිලිවෙල සම්බන්ධයෙන්, පරිපාලනය තුල දැනටමත් යෝජනා වී ඇති විකල්පයන් එනම් වොෂින්ටනයේ තෝරාගත් සතුරෙකුට එරෙහිව න්‍යෂ්ටික අවි යොදා ගැනීම තව කොතෙක් කලක් ප්‍රමාද වනු ඇත්ද?

ඇමරිකානුවන්ට එරෙහිව යුද නීති යොදාගැනීමටත්, දේශපාලන විරුද්ධවාදීන් සිරගත කිරීමටත්, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් එකහෙලා ම පාගා දැමීමටත් තුඩුදෙන්නා වූ මිලිටරිකරනයකට එක්සත් ජනපද සමාජය යොමුවීම තව කොතෙක් කල් ප්‍රමාද විය හැකිද?

ඇමරිකාවේ ව්‍යාපාර හා මූල්‍ය ප්‍රභූ පැලැන්තිය විසින් පාලනයේ දී යොදාගන්නා විධික්‍රමයන්ගේ එවන් මාරුවක් සිදුවෙමින් පවතින බවට දිනපතා ම අලුත් ඇඟවීම් දැක ගත හැකි ය. පසු ගිය සිකුරාදා ධවල

මන්දිර මාධ්‍ය සමුලුවකදී එක්සත් ජනපද ආන්ඩු මනෝගතියේ තර්ජනාත්මක ප්‍රකාශනය දක ගත හැකි විය. වාර්තාකරුවෙකුගේ අසාමාන්‍යවූ දැඩි ප්‍රශ්නයකට එනම් මැද පෙරදිග තුල එක්සත් ජනපදය සතු බලපෑම පිරිහී ඇත්තේ මන් ද?, යන්නට පිලිතුරු ලෙස බුෂ් කියා සිටියේ එය ත්‍රස්තවාදීන්ගේ වරද බවයි. "සිය අරමුනු ඉටු කර ගැනීමට ඔවුන් අහිංසක ජනතාව මරා දමති. ඔවුන්ට රූපවාහිනී තිර මත ඉඩකඩ සැලසී ඇත. ඒ ගැන ප්‍රශ්න අසන, හාරා අවුස්සන මිනිස්සු ඔවුන්ට ලැබී තිබේ. ඔව්, මේක, ඒක හෝ අනික් එක ය."

මෙහි පැහැදිලි ඇඟවුම වන්නේ, පරිපාලනයේ මැද පෙරදිග ප්‍රතිපත්ති ගැන ප්‍රශ්න කරන ඕනෑ ම මාධ්‍යවේදියෙක් ත්‍රස්තවාදයේ ආධාරකරුවෙකු වන බවයි. එහි තර්කාන්විත නිගමනය නම් ඔවුන් සිරගත කොට, ඔවුනගේ ප්‍රකාශන වසා දැමිය යුතු බවයි.

බෙරයේ දෙඇස මෙන් වූ මිලිටරි කොමිෂන් සභා මතින් අනියත කාලයක් අත් අඩංගුවේ රඳවා තබා ගැනීමත්, නඩු විභාග කිරීමත් වැනි, "සතුරු සටන්කරුවන්" මෙන් ම ඇමරිකානු පුරවැසියන් ද මතට, ගුවන්තනාමෝ විධික්‍රමයන් ම විහිදුවා ලිය හැකි නීති රීති බුෂ් පරිපාලනය විසින් ගෙනයනු ලබන බවට තොරතුරු හෙලිදරව්වීමත් සමග මෙම වර්ධනයන් සිදු වෙමින් තිබේ.

ගෝලීය යුද්ධය හා ෆැසිස්ට්වාදය වැනි, 1930 ගනන්වල මනුෂ්‍යයා මතට කඩාපාත්වුනු ශෝකාන්තයන් ඊටත් වඩා බිහිසුනු පරිමානයෙන් යලි සිදු නොවීමට නම් කම්කරු පන්තිය සිය විකල්පය ඉදිරියට ගත යුතු ය. දිනපතා ම ඉරාකයේ දී ත් ලෙබනනයේදීත් කරගෙන යන ඝාතනයන් හා ඒවා යුක්තිසහගත කිරීමට දෙසා බාන බේගල් පිලබඳව පිලිකුල දැනවීම පමනක් ප්‍රමානවත් නොවේ. මෙම අපරාධයන්ට විරෝධය පලකිරීම වුවද සෑහෙන්නේ නැත ඒවාට අවසන් තිත තැබීමට හැකි නව දේශපාලන බලවේගයක් නිර්මානය කල යුතු ය.

මෙය සාක්ෂාත් කල හැක්කේ, සමාජය සමාජවාදී ලෙස පරිවර්තනය කිරීමේ පොදු අරගලයක් තුල, මැද පෙරදිග අරාබි මෙන්ම යුදෙව් කම්කරුවන් ද ඇතුලත් කර ගනු ලබන කම්කරු ජනතාව ජාත්‍යන්තරව ඒකාබද්ධ කිරීමේ ඉදිරිදර්ශනයක් මත, පවත්නා මහා ව්‍යාපාරිකයන්ගේ පක්ෂවලින් ස්වාධීනව කම්කරු පන්තියේ නව දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම මගින් පමනි.

දෙසැම්බරයේ දී එක්සත් ජනපදයෙහි පැවැත්වෙන වාරමැද මැතිවරනවල තුල, සමාජවාදී සමානතා පක්ෂය මගින් ගෙන යනු ලබන මැතිවරන ව්‍යාපාරයේ මූලික අරමුන මෙයයි. රිපබ්ලිකානු මෙන්ම ඩිමොක්‍රැටික් පක්ෂය තුල ද අංග ලක්ෂිත, දේශපාලන ප්‍රතිගාමීත්වය සමාජ අසමානතාව හා යුද්ධයේ ප්‍රතිපත්තීන් කෙරෙහි කම්කරු පන්තිය තුල පවතින ගැඹුරට මුල් විහිදුනු විරුද්ධත්වයට ප්‍රකාශනයක් අත් කරදීම සඳහා අපගේ අපේක්ෂකයන් සටන්වැද සිටියි.

ඉරාකයෙහිත් ලෙබනනයෙහිත් සිදුවන ලේ ස්නානයට එරෙහිව හා එය අවසන් කිරීමේ පියවර ගැනීමේ අවශ්‍යතාවෙන් පෙලෙන සියලු දෙනාගෙන් අප ඉල්ලා සිටින්නේ, සමාජවාදී සමානතා පක්ෂයේ ක්‍රියා මාර්ගය හදාරන ලෙසත්, අපගේ අපේක්ෂකයන් ඡන්ද ලේඛනයට ඇතුල් කිරීමේ උද්ඝෝෂනයට සහභාගිවන ලෙසත් කම්කරු පන්තිය තුල නව විප්ලවවාදී නායකත්වයක් ගොඩනැගීමේ අරගලයට පක්ෂය සමග ඒකාබද්ධවන ලෙසත් ය.

© www.wsws.org